දිනමිණ සිළුමිණ The Silumina
epaper

අයදුම්පත් කැඳවීම

සීමාසහිත මොරවක්කෝරළේ තේ නිපදවත්තත්ගේ සමුපකාර සමිතියේ පූරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අනුමත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. කනිෂ්ඨ තේ නිෂ්පාදක තනතුර - III ශ්‍රේණිය (OPL-2)

අවශ්‍ය සුදුසුකම්:

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය ගණිතය, සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව, ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම

සහ

(ආ) ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ/ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ NVQ III මට්ටමේ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ඇ) තේ කර්මාන්ත ශාලාවක පහතරට තේ නිෂ්පාදනය පිළිබඳව අදාළ මට්ටමේ තනතුරක අවු 01කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : 16,500 - 340X5 - 380X5 - 420X10 - 460X10 - 500X12 - 34,900

2. ප්‍රධාන තේ නිෂ්පාදක තනතුර - III ශ්‍රේණිය (EL - 03)

අවශ්‍ය සුදුසුකම්:

(අ) අ.පො, ස, (සාමාන්‍ය පෙළ) විභාගය ගණිතය, සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව, ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

(ආ) ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ NVQ IV මට්ටමේ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ඇ) තේ කර්මාන්ත ශාලාවක පහතරට තේ නිෂ්පාදනය පිළිබඳව අදාළ මට්ටමේ තනතුරක අවු.10කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම සහ ඉන් වසර 05ක් ප්‍රධාන තේ නිෂ්පාදක තනතුරක සේවය කර තිබීම.

හෝ

(ඇ) SUL මට්ටමේ ජ්‍යෙෂ්ඨ සහකාර තේ නිෂ්පාදක I/II ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම.

වැටුප් පරිමාණය : 22,000 - 600X5 - 680X5 - 760X10 - 840X10 - 920X12 - 55,440

3. ගණකාධිකාරී තනතුර - III ශ්‍රේණිය (EL - 03)

අවශ්‍ය සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය, කළමනාකරණ, ගණකාධිකරණ. ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම.

හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අත්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාරික සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර විභාගය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත්වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම.

හෝ

(ඇ) SUL - මට්ටමේ II ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී/ සහකාර අභ්‍යන්තර විගණක/ සහකාර බැංකු සේවා කළමනාකරු/ බැංකු සහකාර තනතුරක වසර 02ක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ ගිණුම්කරණය/ මූල්‍ය කළමනාකරණය/ බැංකුකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

(ඇ) OPL - 1 මට්ටමේ I ශ්‍රේණියේ බැංකු ගිණුම්/ මූල්‍ය/ අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක සේවය කිරීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස්පෙළ විභාගය සමත් වීම / ගිණුම් කරණය/මූල්‍ය කළමනාකරණය/බැංකුකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

(ඉ) OPL - 2 මට්ටමේ I ශ්‍රේණියේ බැංකු/ ගිණුම්/ මූල්‍ය/ අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක වසර 03ක් සේවය කිරීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම/ ගිණුම්කරණය/මූල්‍ය කළමනාකරණය, බැංකුකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

වැටුප් පරිමාණය : 22,000 - 600X5 - 680X5 - 760X10 - 840X10 - 920X12 - 55,440

අමතර දීමනා :-

- සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත රු:2,500/= ජීවන වියදම් දීමනාව සහ රු:5,000/= අතිරේක දීමනාව සහ ඉදිරියේ දී අනුමත වන දීමනා.
- අතිකාල ගෙවීම්.
- වාර්ෂික විනෝද චාරිකා
- සේවක අවමංගල්‍යාධාර පහසුකම්
- වාර්ෂික දිරිදීමනා
- සහන මිලට තේ කුඩු
- මාසික දිරිදීමනා
- සේවක අත්තිකාරම් ණය
- වාර්ෂික තිල ඇඳුම්
- රක්ෂණාවරණ

වයස : අවු:18ට නොඅඩු විය යුතු අතර, වයස අවු:45ට නොවැඩි විය යුතු ය. දැනටමත් සමුපකාර සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමා බලපාතු නොලැබේ.

ඉහත අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කරනු ලබන අයදුම්පත් 2024.02.09 දින ප.ව. 03.00ට හෝ ඊට පූර්ව ලැබෙන සේ **ගරු සභාපති - සීමාසහිත මොරවක්කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය - කොටපොළ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සභාපති,
සී/ස මොරවක්කෝරළේ තේ නි.සමු. සමිතිය, කොටපොළ.
2024.01.26